# සමාජ සේවා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධි පන්තිය නිලධර ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

## 01. සම්බන්ධ වන ආයතන

| | | | |
|---|---|---|---|
| 1.1 දෙපාර්තමේන්තුව : සමාජ සේවා | යොමු අංකය:SS/1/1/1/07 | දිනය: 2012.07. |
| 1.2 අමාත්‍යාංශය : සමාජ සේවා | යොමු අංකය:MSS/3/2/1/ ස.සේ./SOR/21 | දිනය: 2012.03.18 |
| 1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම : | යොමු අංකය: DMS/C3/40 | දිනය:2011.03.10 |
| 1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය : | යොමු අංකය: EST-3/RECRU /04/6935 | දිනය:2012.02.28 |
| 1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය : | යොමු අංකය: NSCC/5/40/1/ SR-1 | දිනය: 2012.02.15 |
| 1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය: | යොමු අංකය:PSC/EST/4/1/ 40/1/20 | දිනය: 2012.06.22 |

## 02.පත් කිරීම් බලධරයා පිළිබඳ විස්තර

2.1 පත් කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## 03. නිලධර ගණය පිළිබඳ විස්තර

3.1 නිලධර ගණය : කළමනාකරණ සහකාර අධි පන්තිය

3.2 ශ්‍රේණි : විශේෂ ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය : තනතුරට පැවරෙන ප්‍රධාන කාර්යභාරය වශයෙන් කිසියම් පණතක් / ආඥා පණතක් / ප්‍රඥප්තියක් මගින් නිල නාමයෙන් විශේෂිත කොට පවරනු ලබන බලාත්මක කිරීමේ / නියාමනය කිරීමේ / විධිමත් කිරීමේ නෛතික කාර්යයන් විධායක නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ පැවරෙන්නා වූ ද දෙපාර්තමේන්තුවට අයත් වෘත්තීය පුහුණු හා පුනරුත්ථාපන ආයතනවල පරිපාලන හා අධීක්ෂණ කටයුතු සිදු කරන්නා වූ ද සේවා ගණයකි.

## 04. තනතුරේ ස්වභාවය : ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත

## 05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : එම්.එන්.7/2006 ඒ

5.2 වැටුප් පරිමාණය : රු.20,030 - 11x365 - 18x500 - 33,045/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර : 6 වන පියවර (රා. ප. ච. 6/2004(iv) අනුව)

| ශ්‍රේණිය | වැටුප් පියවර | වැටුප් තලය (රු.) |
|---|---|---|
| විශේෂ | පියවර 06 | රු.21,855/- |

## 06. නිලධර ගණයට අයත් තනතුර / තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| ස්ථාන භාර නිලධාරී | 10 | සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්නා වෘත්තීය පුහුණු ආයතන පරිපාලනය කිරීම, පළාත් සහ දිස්ත්‍රික්ක වල සිටින ආබාධ සහිත පුද්ගලයින් පිළිබඳ සමීක්ෂණ පැවැත්වීම, වෘත්තීය පුහුණු ආයතනවලට යොමු කරන ආබාධ සහිත පුද්ගලයන්ට වෘත්තීය පුහුණුව ලබා දීම හා පුහුණුවෙන් පසු සමාජ ගත කිරීමේදී ඔවුන් සම්බන්ධයෙන් පසු විපරම් කිරීම, ඔවුන්ගේ ජීවන තත්වයන් නගා සිටුවීම පිණිස රැකියා අවස්ථා සොයා බැලීම සහ ආයතන ප්‍රධානියා විසින් පවරන අනෙකුත් රාජකාරී. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 10 යි.

දැනට දෙපාර්තමේන්තුව තුල තිබෙන සමාජ සුහසාධන අධිකාරී තනතුරු 03 අහෝසි වන තුරු මේ අතරින් ස්ථානභාර නිලධාරී තනතුරු 03 ක පුරප්පාඩු පිරවීමක් සිදු කෙරෙනු නොලැබේ.

## 07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා අනුපාතය

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | - |
| සීමිත | 100% |
| කුසලතා | - |

7.2 විවෘත බඳවා ගැනීම : අදාළ නොවේ.

**7.3 සීමිත බඳවා ගැනීම**

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : විශේෂ ශ්‍රේණිය

7.3.2 සුදුසුකම්

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් :ක්ෂේත්‍රයට අදාලව ලබා ඇති අතිරේක අධ්‍යාපන සුදුසුකම් විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

7.3.2.2 වෘත්තීය සුදුසුකම් :ක්ෂේත්‍රයට අදාලව ලබා ඇති අතිරේක වෘත්තීය සුදුසුකම් විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

7.3.2.3 පළපුරුද්ද : <u>උපාධියක් සහිත අයදුම්කරුවන් සඳහා</u>

I. සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සමාජ සේවා නිලධාරී තනතුරේ ස්ථිර කර තිබීම සහ

II. එම තනතුරේ පස් (05) අවුරුදු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම

<u>උපාධියක් රහිත අයදුම්කරුවන් සඳහා</u>

I. සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සමාජ සේවා නිලධාරී තනතුරේ ස්ථිර කර තිබීම සහ

II. එම තනතුරේ දස (10) අවුරුදු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම

7.3.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතුය.

7.3.2.5 වෙනත් : තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3.2.6 වයස :අදාල නොවේ.

7.3.3 බඳවා ගැනීමේ ක්‍රමය :පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී උපරිම ලකුණු සංඛ්‍යාවක් ලබා ගන්නා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව බඳවා ගැනේ.

7.3.3.1 ලිඛිත විභාගය : අදාල නොවේ.

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| - | - | - |

7.3.3.1.1 පවත්වන බලධරයා : අදාල නොවේ.

හා / හෝ

7.3.3.2 වෘත්තීය පරීක්ෂණය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| - | - | - |

7.3.3.2.1 පවත්වන බලධරයා : අදාල නොවේ.

හා / හෝ

7.3.3.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | | සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | 100 | අදාල නොවේ |
| 02. අතිරේක වෘත්තීය සුදුසුකම් | 15 | | |
| 03. අතිරේක පළපුරුද්ද | 40 | | |
| 04. පරිගණක හැකියාව | 10 | | |
| 05. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය | 10 | | |
| 06. වෘත්තීය ක්ෂේත්‍රයේ සිදුකර ඇති විශේෂ ක්‍රියාකාරකම් / වැඩසටහන් / ව්‍යාපෘති සඳහා | 05 | | |
| 07. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | 05 | | |

7.3.3.3.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

හා / හෝ

7.3.3.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ.)

ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු : අදාල නොවේ.

7.3.3.4.1සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධාරියා : අදාල නොවේ.

7.4 කුසලතා මත බඳවා ගැනීම : අදාල නොවේ.

**08. කාර්යක්ෂමතා කඩඉම් : අදාල නොවේ.**

**09. රාජ්‍ය භාෂා ප්‍රවීණතාව : අදාල නොවේ.**

**10. ශ්‍රේණි උසස් කිරීම් : අදාල නොවේ.**

**11. තනතුරු වලට පත් කිරීම: : අදාල නොවේ.**

12. මෙම බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් විධිවිධාන වලට අමතරව ආයතන සංග්‍රහයේ සහ අංක 1589/30 හා 2009.02.20 දිනැතිව ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති වලට සෑම නිලධාරියෙකුම යටත් වේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :
සක්‍රිය සේවා කාලය යනු : ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. විධිවිධාන සලසා නොමැති කරුණු : මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් "රාජ්‍ය සේවා කොමිෂන් සභාව / පත්වීම් බලධාරියා" විසින් තීරණය කරනු ලැබේ.

සකස් කලේ : අත්සන :-
නම : කේ.එච්. දිනිති සජ්වීකා
තනතුර : රාජ්‍ය කළමනාකරණ සහකාර (III)
දිනය : 2012.07.09

පරීක්ෂා කලේ : අත්සන :-
නම : බී. ජී. අනූෂා
තනතුර : සහකාර අධ්‍යක්ෂ.
දිනය : 2012.07.
නිල මුද්‍රාව:

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :
නම : හේමචන්ද්‍ර හේවගේ
තනතුර : සමාජ සේවා අධ්‍යක්ෂ.
නිල මුද්‍රාව

දිනය : 2012.07.

යොමු අංකය : **MSS/3/2/1/ස.සේ./SOR/21**

සමාජ සේවා දෙපාර්තමේන්තුවෙහි ස්ථාන භාර නිලධාරී තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන :

නම : එම්.ජේ. ඉමෙල්ඩා සුකුමාර්

ලේකම්,

සමාජ සේවා අමාත්‍යාංශය.

දිනය :2012.

නිල මුද්‍රාව :

---

යොමු අංකය :

සමාජ සේවා දෙපාර්තමේන්තුවෙහි ස්ථාන භාර නිලධාරී තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2012 . දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

අත්සන :

නම :

දිනය : 2012.

නිල මුද්‍රාව :